---

**මාතර ප්‍රාදේශීය සභාව.**

**මාතර දිස්ත්‍රික්කය.**

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලොචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 20 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මාතර ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය පකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සේවක ඇප ලේඛණය අනුව සෙවක ඇප ආයෝජන අගය රු. 17,067 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු. 2,000 ක් ලෙසට දක්වා තිබුණෙන් වෙනස රු.15,067 ක් විය.

(ආ) ජංගම වගකීම් යටතේ දැක්විය යුතු රු.800 ක සේවක ණය වැඩිපුර අයවීම, මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ 2009 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.71,867,673 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙසට රු.74,867,673 ක් දක්වා තිබීමෙන් වෙනස රු.3,000,000 ක් විය.

(ඈ) ස්ථාවර තැන්පත් ගිණුමේ රු.1,353,098 ක් වූ ආරම්භක ශේෂය ලෙජරයට සටහන් කිරීමේදී රු. 1,233,097 ක් ලෙසට සටහන් කර තිබීමෙන් වෙනස රු.120,000 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය ගිණුමේ ගෙවිය යුතු වටිනාකම රු.16,374,675 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනය අනුව වටිනාකම රු.16,528,687 ක් වූ හෙයින් වෙනස රු.154,012 ක් විය.

(ඊ) 2008 වසරේ සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩා කාමරයක තබා තිබූ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ ශාරීරික ව්‍යායාම උපකරණ 4 ක් හා බර ඉසිලීමේ උපකරණ කට්ටලයේ වටිනාකම අගයකර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ නිමකර තිබූ රු.1,974,916 ක් වූ ඉදිකිරීම් හතරක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම් ලෙස දක්වා නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ බලපත්‍ර සඳහා ලැබිය යුතු රු.31,362 ක් ගිණුම් වලින් අතහැර තිබුණි.

(ඒ) අංක 1-51-006387-9 දරණ බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොත අනුව ශේෂය රු.212,929 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල රු.4,818 ක් ලෙසට දක්වා තිබුණෙන් වෙනස රු.208,111 ක් විය.

1.3.2 අනුචිත හෙළිදරව් කිරීම්.

පහත දැක්වෙන අනුචිත අනාවරණය කිරීම් නිරීක්ෂණය විය.

1993 වර්ෂයේ සිට පැවත එන ෆයිබර් වැඩ තොගයක වටිනාකම වූ රු. 195,877 ක්, අයකර ගත හැකි උපයෝගී සේවා ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු.15,278,752 ක් විය.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,519,796 ක දායක මුදල් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා රු.151,703,682 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය ශේෂය සමඟ සසඳා අතරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 217-218 | සමාලෝචිත වර්ෂය සඳහා සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය |

කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි

| | |
|---|---|
| (i) මු.රෙ. 387 | (අ) රජයේ ගිණුම්වල අයිරා පවත්වාගෙන යා නොහැකි වුවත් ඊට පටහැනිව බැංකු ගිණුම් 04 කින් අයිරා ලබා ගැනීම නිසා රු.12,123 ක මුදලක් පොලී වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| | (ආ) මුදල් රෙගුලාසි ප්‍රකාර රාජ්‍ය ආයතන බැංකු අයිරා පහසුකම් ලබා ගැනීම නොකල යුතු වුවත් සභාව සතු අංක 032100102475915 දරන හා අංක 032100122475919 දරන බැංකු ගිණුම් වලට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතෙහි පිළිවෙලින් රු.188,003 ක් හා රු.924,071 ක අයිරා ගැන්වී තිබුණි. |
| (ii) මු.රෙ. 395 | අංක 032100102475915 දරණ බැංකු ගිණුමේ රු.73,000 හඳුනා නොගත් හර හා වැඩිපුර තැන්පත් රු.66,179 ක ශේෂ නිරවුල් නොකර බැංකු සැසඳුමේ දක්වා තිබුණි. |
| (iii) මු.රෙ. 507 | අතැත තොගවල අගය වාර්ෂිකව ගිණුම්වල ඇතුළත් කිරීම සඳහා වර්ෂය අවසන් දිනට භෞතික සත්‍යාපනය කර ස්ථාවර වත්කම් වල පැවැත්ම පිළිබඳ ප්‍රකාශයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ.

| | |
|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි - 2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | සභාව සතු මහින්ද විජේසේකර පරිගණක මධ්‍යස්ථානය, කාර්යාලය, හා නැණසල යන ස්ථානයන්හි පවතින පරිගණක 14 ක් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4:2:3 වගන්තිය | ප්‍රාදේශීය සභා නිලධාරීන්ට 2010 වර්ෂයේ ණය ගෙවීම් සිදු කිරීමේදී ණය ඉල්ලුම් පත හා ඊට අදාල ආකෘති පත්‍ර නිලධාරියා විසින් විධිමත්ව සකස් කර ඉදිරිපත් කළ යුතු අතර නිසි අධීක්ෂණයකින් පසු ගෙවීම් සිදුකල යුතු වුවද දෙපාර්තමේන්තු ප්‍රධානියා අනුමත කිරීමකින් තොරව ණය ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය. |
| (ඉ) 1999 ජුනි 11 දිනැති අංක ආ/3/1/1-1 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2010 වර්ෂයේ ගෙවීම් සිදු කර තිබූ සියළුම ණයලාභීන් සිය සත්භාවයෙන් කරනු ලබන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 1996 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය නිලධාරීන් විසින් තැබිය යුතු ඇප මුදල් ප්‍රමාණයන් සංශෝධනය කර තිබූ අතර ඒ අනුව නිලධාරීන් හා සේවකයන් 06 දෙනෙකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.3,153,562 ක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 39,574 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් ඇතුළු හිඟ ආදායම් පිළබඳ තොරතුරු 2011 පෙබරවාරි 23 දිනැති මාගේ ලිපියට අනුව නියමිත අකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශ අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම | | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | 2010 | 2009 | | |
| | රු. | රු. | % | % |
| වරිපනම් | 592,220 | 579,148 | 2.25 | - |
| අක්කර බදු | 15,482 | 38,819 | - | 60.11 |
| වෙනත් ආදායම් | 39,107,885 | 33,950,334 | 15.15 | - |

හිඟ බදු හා ගාස්තු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාලව සභාවට අයවිය යුතු රු.39,715,587 ක හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.200,000 දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

#### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.5,000,000ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

## 2.2.4 කඩ කාමර බදුදීම

(අ) සභාව සතු කැකනදුර ස්වරණ පුර කඩ කාමර 11 ක් හා පරණ කඩ 4 ක් ඇතුළු කඩ 14 කින් කඩ කාමර 8 ක ගිවිසුම් කොන්දේසි 5.2.23 පරිදි ගිවිසුම් කාලය ඉක්මගොස් තිබූ අතර කඩ කාමර 07 ක් කිසිදු ව්‍යාපාරික කටයුත්තක් සඳහා නොයොදා වසා දමා තිබුණි.

(ආ) මේ හේතුවෙන් වෙළඳ පොලේ තරඟකාරීත්වය අඩුවී එමගින් පාරිභෝගික ජනතාවට සේවයක් ඉටු නොවීමෙන් කඩ කාමර ඉදිකිරීමට වැයකල පිරිවැය මහජන යහපතෙහි යෙදවී නොමැති බවද නිරීක්ෂණය විය.

(ඇ) අංක 04 හා අංක 05 කඩ කාමර වලින් පිළිවෙලින් රු.9,000 ක කුලී හා හිඟ හිටි රු.263,718 ක එක්වන් මුදලක් 2011 ජුනි 02 දින වන විටත් අයවී නොතිබුණි.

(ඈ) කඩ බදු ගිවිසුමේ 5.2.5, 5.2.15 හා 5.2.19 ඡේදයන්ට පටහැනිව පිළිවෙලින් අතුරු බදුදීම හා කඩ කාමර වෙනස් කිරීම් සිදුකර තිබුණි.

(ඉ) බදු ගිවිසුමේ 5.2.5 වගන්තිය ප්‍රකාරව සභාපති/ලේකම්ගේ පූර්ව අවසරය නැතිව බදුකරු විසින් එකී කඩ කාමරය හෝ යම් කොටසක භුක්තිය වෙනත් අයෙකුට විකිණීම පැවරීම හෝ අතුරු බදුදීම හෝ නොකල යුතු බව දක්වා තිබණද අංක 01 කඩ කාමරය රු.6,000 ක මුදලකට බදුකරු වෙනත් අයෙකුට බදුදී තිබුණි.

(ඊ) දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ප.පා.කො/2010/01/ දරන පළාත් පාලන ආයතන සතු කඩකාමර බදුදීම සම්බන්ධ චකලේඛයේ ක්‍රියා පටිපාටි අංක 4,5,6,7 හා 11 ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

## 2.2.5 දුරකථන/විදුලි සංදේශ කුළුණු ගාස්තු

සභා බල ප්‍රදේශයේ ස්ථානගත කර තිබූ දුරකථන හා විදුලි සංදේශ කුළුණු සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2008 දෙසැම්බර් 16 හා අංක 05/2/1/384 දරණ ලිපියේ V වන උපලේඛණයේ අංක 06 (II) පරිදි සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම සඳහා විදුලි සංදේශ කුළුණු වලින් රු.110,000 ක පෙරසැරි ගාස්තු අයකරගත යුතු වුවද, එකී ගාස්තු අයකිරීමේ ආදායම් ලේඛණයක් හෝ වෙනත් තොරතුරු ඇතුලත් ගොණුවක් පවත්වා නොතිබූ හෙයින් එම මුදල් අයවූ බවට තහවුරු නොවීය.

(ආ) ඉහත ලිපියේ අංක 07 (V) පරිදි විදුලි සංදේශ කුළුණු දැනට ක්‍රියාත්මක වෙමින් තිබුණද ඒවා සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබූ අතර අයකරගත යුතු මුදල රු.10,000 ක් විය.

(ඇ) 2008 දෙසැම්බර් 05 දිනැති අංක 2008/288 හා 2009 දෙසැම්බර් 02 දිනැති අංක 2009/272 දරණ දුරකථන ඉදිකිරීම් ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවීය.

2.2.6 <u>ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය, ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ ගාස්තු අයකිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වගන්තිය හා 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරණ ගැසට් පත්‍රයේ පරිදි පනවා ඇති අතුරු ව්‍යවස්ථාවේ 39 ඡේදයේ ප්‍රකාරව ප්‍රදර්ශනය කෙරෙන දැන්වීම් වලින් ගාස්තු අයකිරීමට 2010 ඔක්තෝබර් 29 දිනෙන් මහා සභාව තීරණය කර තිබුණි.

(අ) සභා බල ප්‍රදේශයේ නියැදියක් ලෙසට තෝරාගත් ස්ථාන කිහිපයක 2011 ජූනි 03 දිනැති භෞතික පරීක්ෂාවේදී ඉහත ගැසට් පත්‍රයේ උපලේඛණයේ දැක්වෙන ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය වෙමින් තිබුණි. එලෙස ප්‍රදර්ශනය කෙරෙමින් තිබූ දැන්වීම් 28 කින් රු.53,736 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

(ආ) ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ආදායම් ලේඛණයක් පවත්වා නොතිබීමෙන් සභා බල ප්‍රදේශයේ ගාස්තු අයවීම නිවැරදිව සිදුව ඇති බව තහවුරු නොවීය.

2.3 <u>වියදම් ව්‍යුහය.</u>

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 23,772 | 19,615 | 4,157 | 24,533 | 18.646 | 5,887 |
| අනෙකුත් | 23,578 | 17,548 | 6,030 | 17,344 | 14,825 | 2,519 |
| උප එකතුව | 47,350 | 37,163 | 10,187 | 41,877 | 33,471 | 8,406 |
| ප්‍රාග්ධන වියදම | 102,560 | 34,190 | 68,370 | 90,875 | 29,439 | 61,436 |
| මුළු එකතුව | 149,910 | 71,353 | 78,557 | 132,752 | 62,910 | 69,842 |

2.4 මානව සම්පත් කළමනාකරණය.

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | ඌණතාවය/අතිරික්තය | |
|---|---|---|---|---|
| මාණ්ඩලික | 01 | - | 01 | - |
| ද්විතියික | 17 | 14 | 03 | - |
| ප්‍රාථමික | 28 | 26 | 02 | - |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 43 | - | 43 |
| | 46 | 83 | 06 | 43 |

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙතින් වැටුප් සඳහා ප්‍රතිපූර්ණය වූ මුදල රු.9,864,000 ක් වුවද වියදම රු.19,173,404 ක් වූයෙන් රු.9,309,404 ක වෙනස සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතන වල අනියම්, තාවකාලික, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගැනීම අත්හටුවා ඇතත් එකී විධිවිධානයට පටහැනිව සේවකයන් 43 ක් බඳවා ගෙන 2010 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දින දක්වා සභා අරමුදලින් වැටුප් වශයෙන් රු.7,654,647 ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකළහොත් අදාල ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටී.

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 නිෂ්ක්‍රීය වත්කම්

2006 වර්ෂයේදී රු.675,000 කට මිලදී ගත් විදුලි ජනක යන්ත්‍රයක් සහ 2009 වර්ෂයටත් පෙර සිට ගිණුම්වල පැවත එන රු.90,386 ක් වටිනා ෆයිබර් තොගයක් විගණිත දිනවූ 2011 ජුනි 2 දිනය දක්වාම නිෂ්ක්‍රීයව පැවතුනි.

2.6 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 39,715,587 ක් විය.

2.7 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 1,504,058 ක් විය. සේවය හැරගිය, විශ්‍රාම ගිය හා ස්ථාන මාරුවී ගිය සේවකයන් හය දෙනෙකුගෙන් අයවිය යුතු රු.7,300 ක් දිගු කාලයක් තිස්සේ අයනොවී පැවතුනි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

2.8.1 අතුරු ව්‍යවස්ථා විධිවිධාන ක්‍රියාත්මක නොකිරීම.

මාතර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ලේඛණගත බේකරි ස්ථාන 17 ක් වූ අතර නියැදියක් ලෙස තෝරාගන්නා ලද බේකරි දෙකක් පිළිබඳව 2011 ජුනි 02 දින සභාවේ ආදායම් පරීක්ෂකවරයා සමඟ සිදුකල ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ගැසට් පත්‍රයෙන් 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ එකී කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවල ඇතුලත් විධිවිධාන අඩංගු අතුරු ව්‍යවස්ථා සෑදීමට 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 221(අ) වගන්තිය සමඟ කියවිය යුතු 122 සහ 126 වන වගන්ති වලින් ප්‍රාදේශීය සභාවට බලය පැවරී තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ බේකරි ඉහත අතුරු ව්‍යවස්ථාවේ 16.3.2 (ආ), 16.3.3 (ආ), 16.5, 16.6, 16.8, 16.22, 16.23 හා 16.26 පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) පරීක්ෂාවට ලක්වූ බේකරි ඉතා අපිරිසිදු තත්ත්වයේ ඒවා වුවද ඒවා සභා බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ පරීක්ෂාවට ලක්වී නොතිබුණි.

2.8.2 වීථි පහන් නඩත්තුව

සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තුව පිළිබඳව සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී පහත සඳහන් තොරතුරු අනාවරණය විය.

(i) වීථි පහන් නඩත්තුව සම්බන්ධයෙන් විදුලි උපාංග මිලදී ගැනීමේදී අවශ්‍යතාවය පරිදි නඩත්තු විදුලි කාර්මිකගේ ඉල්ලීම හා ඒ සඳහා කාර්මික නිලධාරියාගේ අනුමැතිය තුලින් ඒවා මිලදී ගැනීම සිදුකල යුතු වුවත් එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) සභා බල ප්‍රදේශය තුල නඩත්තුව සිදුවන වීථි පහන් එකිනෙක වෙන්කොට හඳුනාගැනීම සඳහා අංක හෝ සංකේත ක්‍රමයක් භාවිතා කරමින් එක් එක් වීථි පහන් සඳහා විදුලි බුබුළු හා අනෙකුත් උපාංග සවි කිරීමේදී ලේඛණයක් නඩත්තු කල යුතු වුවත් එය සිදුවී නොතිබුණි.

(iii) 2006 වසරේ සිට 2010 වසර දක්වා වීථි පහන් නඩත්තු කටයුතු වෙනුවෙන් සභාව ලංකා විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලුම්කර තිබූ සම්පූර්ණ මුදලම ලැබී නොතිබූ අතර 2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ මුදල රු.141,296 ක් විය.

2.8.3 හඳුනාගත් පාඩු

2009 හා 2010 වර්ෂවල නාවිමන උතුර ප්‍රජා ශාලාව සඳහා විදුලිය බිල්පත් වෙනුවෙන් රු.12,380 ක මුදලක් ගෙවීම පැහැර හැරීම නිසා විදුලිය විසන්ධි කරන ලදුව නැවත විදුලිය ලබා ගැනීම වෙනුවෙන් විදුලි බල මණ්ඩලයට රු.8,342 ක අතිරේක මුදලක් ගෙවීමෙන් සභා අරමුදලට පාඩු සිදුකර තිබුණි.

2.8.4 වාහන පාලනය

(අ) සියළුම වාහන සම්බන්ධයෙන් ලොග් සටහන් තබා නොතිබුණ හෙයින් අළුතින් උපකරණ ලබා ගැනීම, සේවා කිරීම්, ටයර් ටියුබ් මාරු කිරීම ආදී තොරතුරු නිසි පරිද හඳුනා ගැනීමට නොහැකි විණි. වාහන අළුත්වැඩියා සිදු කිරීමෙන් පසුව වාහන භාර නිලධාරියා විසින් ඒ බව සනාථ කරමින් අත්සන යොදා තහවුරු කර නොතිබුණි.

(ආ) සභාව ඉන්ධන ලීටර් 500 ක තොගයක් තබාගෙන ඉන්ධන නිකුත් කිරීම සිදුකර තිබූ අතර එහි භාරකාරත්වය ආදේශක කම්කරුවෙකු වෙතට පැවරීම නිසා ඉන්ධන ලැබීම් නිකුත් කිරීම් ලේඛණයේ ශේෂ කිරීම් අඩුවීම් හා වැඩිවීම් සිදුව තිබූ බව නිරීක්ෂණය විය.

2.8.5 ඉඩම් අනුබෙදුම් සඳහා ගාස්තු අයවීම හා පොදු පහසුකම් කොටස් ලැබීම.

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ 1992 සැප්තැම්බර් 30 දිනැති සංවර්ධන රෙගුලාසි චක්‍රලේඛ අංක 06 හි 2.1 ජේදය හා අධිකාරියේ 1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන ගැසට් පත්‍රයේ 22 (1) නියෝගය පරිදි අනුබෙදීමට අදහස් කරන ඉඩම් කොටස හෝ භූමි භාගය හෙක්ටයාරයකට වඩා විශාල වන්නේ නම් එසේ වැඩිවන අවස්ථාවක වීථි අත්හැරීමෙන් පසු ඉඩමෙන් 10% කට නොඅඩු ප්‍රමාණයක් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුසු ඉඩමක් වෙන්කළ යුතු වුවද එකී විධි විධානවලට අනුව වෙන්කිරීම් කර නොතිබූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

මාතර තල්පාවිල පිහිටි සනී සයිඩ් ඉඩම් ස්වර්ණපුර ව්‍යාපෘතියෙන් රු. 232,967 ක් වටිනා පර්චස් 15.77 ක්ද, තල්පාවිල කහටගහවත්ත ඉඩම (ගෝල්ඩන් සිටි) සඳහා රු.918,353 ක් වටිනා පර්චස් 54.29 ක් සභාවට ලැබී නොතිබූ අතර සිල්වඩේල් වත්ත ඉඩමෙන් පර්චස් 193.42 ක් අඩුවෙන් ලැබී තිබුණි.

(ආ) ඉහත රෙගුලාසි චක්‍රලේඛ අංක 06: (vi) හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය පරිදි අනුබෙදුම් ඉඩම් විකිණීමේදී 1% ක බද්ද ලෙසට තල්පාවිල පිහිටි සනීසයිඩ්වත්ත ඉඩමෙන් රු.631,736 ක්ද කැකනදුර නැගෙනහිර සිල්වඩේල් වත්ත ඉඩමෙන් රු.134,819 ක් ද අයවී නොතිබූ අතර තවත් එවැනි ඉඩම් තුනකින් කිසිදු මුදලක් අයවී නොතිබුණි.

(ඇ) 2009 අප්‍රේල් 17 දිනැති 1597/8 දරන ගැසට් පත්‍රයේ V වන උපලේඛණයේ VII ජේදය පරිදි ඉඩම් පහකින් ඉඩම් අනුබෙදුම් සඳහා අනුකූලතා සහතික ලබාදී නොතිබුණි. මෙවැනි සහතිකයක් ලබාගෙන නොමැති අවස්ථාවල විකිණීම ආරම්භ වූ දින සිට දිනකට රු. 50 බැගින් ගාස්තු අයකල යුතු වුවද එය සිදුව නොතිබුණි.

(ඇ) පොදු හා විනෝද කටයුතු සඳහා ගල්කුළු, වගුරු, බෑවුම් රහිත වඩාත් ප්‍රසස්ථ වූ ස්ථානයකින් සභාවට අදාල කොටස වෙන්කළ යුතු වුවද, එය සඳුව නොතිබුණි. බොහෝ කොටස් වගුරු, කඳු බෑවුම් හා කුඩා කුඩා කැබලි වලින් ලැබී තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) ඉඩම් අනුබෙදුම් සඳහා කමිටු තීරණ ලබාදීමේදී පනවනු ලබන කොන්දේසි ප්‍රකාර ඉඩම තුල මාර්ග හා කාණු ඉදිකිරීම හා ඒවා නඩත්තු කිරීම, ජලය, විදුලිය සැපයීම නියමිත පරිදි සිදුව නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

2.9 <u>අභ්‍යන්තර විගණනය</u>

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන.</u>

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් පාලනය
(ඇ) ගබඩා පාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය

එස්එන්/එම්ආර්/ බී/ 2010 ජුලි දින.

මා.ප්‍රා.ස./අ.ගි./2009

සභාපති,

ප්‍රාදේශීය සභාව,

මාතර

**මාතර ප්‍රාදේශීය සභාවේ 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

යථෝක්ත වාර්තාවේ කෙටුම්පතක් මේ සමඟ එවා ඇත.

02. එම වාර්තාවේ සාවද්‍ය හෝ එකඟවිය නොහැකි හෝ ප්‍රසිද්ධ කිරීම මහජන යහපතට පටහැනි වන්නේ යැයි අදහස් කරන කරුණු කිසිවක් වේ නම්, මෙම ලිපියේ දින සිට දින හතක් ඇතුළත මා වෙත දැන්වීමට කටයුතු කළයුතු අතර මෙම කරුණු පිළිබඳව තවදුරටත් ඔබ සාකච්ඡා කරන්නට අදහස් කරන්නේ නම් ඒ බව දින තුනක් ඇතුළත මා වෙත දන්වන්නේ නම් මැනවි.

03 ඉහත සඳහන් පරිදි දින හතක් ඇතුළත ඔබෙන් පිළිතුරක් නොලදහොත් කෙටුම්පත් වාර්තාවේ සඳහන් කරුණු වලට ඔබ එකඟ වූ ලෙස සලකා මෙම වාර්තාව පදනම් කරගෙන අවසාන වාර්තාව නිකුත් කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.

( ඩබ්. ප්‍රේමනන්ද )
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත් :- 01. ලේකම් - පළාත් පාලන අමාත්‍යාංශය - දකුණු පළාත
02. පළාත් පාලන සහකාර කොමසාරිස් - මාතර